සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## ඉන්දීය ඉතිහාසය - I

**13 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

- **මෙය ප්‍රශ්න 40 කින් යුක්ත වේ. ලකුණු 40 කි.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි**

---

(01) (1) භාරුත් (2) සාංචි (3) අමරාවතී (4) ගුප්ත (5) වත්ස (........)

(02) (1) ඉන්ද්‍ර (2) මිත්‍ර (3) වරුණ (4) රාම (5) අග්නි (........)

(03) (1) ගෝධාවරී (2) කෘෂ්ණ (3) නර්මදා (4) පෙන්නාර් (5) කාවේරි (........)

(04) (1) වසුමිත්‍ර (2) අශ්වඝෝෂ (3) වසුබන්ධු (4) වාල්මිකී (5) නාගර්ජුන (........)

(05) (1) කාර්ලේ (2) අජන්තා (3) මල්ල (4) කෝලිත (5) ලිච්ඡවි (........)

(06) (1) චතුර්වේද (2) බ්‍රාහ්මණ (3) පුරාණ (4) උපනිෂද් (5) ආරණ්‍යක (........)

(07) (1) ශාකුන්තල (2) නාගානන්ද (3) මේඝදූත
(4) මාලවිකාග්නිමිත්‍ර (5) මච්ඡකටිකා (........)

(08) (1) ඉන්ද්‍රප්‍රස්ථ (2) පුරුෂපුර (3) කෞශම්බි (4) ක්‍රිෂ්ණ (5) පාටලීපුත්‍ර (........)

(09) (1) නාලන්දා (2) ඕදන්තපුරු (3) ජගද්දාලා (4) වික්‍රමශිලා (5) මථුරා (........)

(10) (1) අස්මක (2) අවන්ති (3) කාම්බෝජ (4) ගන්ධාරු (5) ලිච්ඡවී (........)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවලට පද යුගල බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට ගැළපේ. ඒවා අතුරෙන් එක නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේඇති වරහන් තුළලියන්න.**

(11) (1) ශුංග පුෂ්‍යමිත්‍ර (2) කුෂාණ කුජුල කැඩ්පයිසස්
(3) පල්ලව ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (4) සාතවාහන සීමුඛා
(5) පාල ගෝහල (........)

(12) (1) බිම්බිසාර රජු කෝසල දේවි (2) අශෝක රජු විදිසා දේවි
(3) චන්ද්‍රගුප්ත රජු ලිච්චවීකුමාර දේවි (4) කෝසල රජු මල්ලිකා දේවි
(5) පළමු කනිෂ්ක රජු දත්තා දේවි (........)

(13) (1) පිෂ්ටපුර හස්තිවර්මන් (2) අවමුත්ත නීලරාජ
(3) දේවරාෂ්ට්‍ර කුවේර (4) පලක්කය උග්‍රසේන
(5) කුෂ්ඨලපුර ධනංජය (........)

(14) (1) සාංචි ස්තූප (2) මථුරා ලෙන් චිත්‍ර
(3) ගංගෛයිකොණ්ඩ හින්දු දේවාල (4) අජන්තා ලෙන් විහාර
(5) මහාබලිපුරම් පල්ලව රථ (........)

(15) (1) වේද ඍග් වේද (2) බ්‍රාහ්මණ ඓතරේය
(3) පුරාණ මත්ස්‍ය (4) ධර්ම ශාස්ත්‍ර සද්ධර්ම පුණ්ඩරීක
(5) උපනිෂද් චන්දෝග්‍ය (........)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. X තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු Y තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකින් ගැලපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුව Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(16)

| X | Y |
|---|---|
| (i) දේවගිරි | A යාදව |
| (ii) වෙංගි | B මෛත්‍රකයෝ |
| (iii) ද්වාරසුමුදු | C රාෂ්ට්‍රකූට |
| (iv) වලභි | D හොයිසාල |
| (v) මාන්‍යකේතු | E චාලුක්‍ය |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) ACDBE (5) ACBED (........)

(17)

| X | Y |
|---|---|
| (i) කාවේරි | A තංජෝර් |
| (ii) සත්ලේජ් | B රූපාර් |
| (iii) යමුනා | C ප්‍රතිෂ්ඨාන |
| (iv) ගෝදාවරී | D භාරුකච්ඡ |
| (v) නර්මදා | E ඉන්ද්‍රප්‍රස්ථ |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (........)

(18)

| X | Y |
|---|---|
| (i) පද්‍ය | A ගීත ගෝවින්ද |
| (ii) ගද්‍ය | B රාජතරංගනී |
| (iii) ව්‍යාකරණ | C කථා සරිත් සාගර |
| (iv) ඉතිහාස | D මාලතී මාධව |
| (v) නාට්‍ය | E මහාභාෂ්‍ය |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (........)

(19)

| X | Y |
|---|---|
| (i) රුම්මින්දෙයි ටැම්ලිපිය | A අශෝක රජු |
| (ii) අලහබාද් ප්‍රශස්තිය | B පුලකේශීන් රජු |
| (iii) ජුනාගාද් සෙල්ලිපිය | C සමුද්‍ර ගුප්ත රජු |
| (iv) ගතිගුම්බා ශිලාලිපිය | D රුද්‍රදාමන් රජු |
| (v) අයිගෝල් ලිපිය | E ඛාරවේල රජු |

(1) ABCDE (2) AEBDE (3) ACDEB (4) ACBED (5) ADECB (........)

(20) X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | අශෝක රජවීම | A | ක්‍රි.පූ. 273 |
| (ii) | බුද්ධ පරිනිර්වානය | B | ක්‍රි.ව. 78 |
| (iii) | සමුද්‍ර ගුප්ත රජවීම | C | ක්‍රි.ව. 320 |
| (iv) | පළමුවන කණිෂ්ක රජවීම | D | ක්‍රි.ව. 606 |
| (v) | හර්ෂවර්ධන රජවීම | E | ක්‍රි.පූ. 483 |

(1) ABCDE (2) AEBCD (3) ACDEB (4) ACBED (5) ADECB (........)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(21) කාංචිය කුමන ගංගාවක් අසල පිහිටියේද?
(1) ගංගා (2) යමුනා (3) නර්මදා
(4) කාවේරි (5) තප්ති (........)

(22) කාලිංගය මගධයට ඈඳාගත්තේ,
(1) චන්ද්‍රගුප්ත මෞර්ය රජු (2) අශෝක රජු (3) බින්දුසාර රජු
(4) කුණාල (5) බෘහද්රථ (........)

(23) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ගඩොල් කන්ද නොහොත් හරප්හ නගරය පැරණි නගරයක් බව සනාථ කරන ලද පුරාවිද්‍යාඥයා කවරෙක්ද?
(1) ජෝර්ජ් මාර්ෂල් (2) දයාරාම්ශනාර (3) ඇලෙක්සැන්ඩර් කනිංහැම්
(4) ස්ටුවට් පිගොඩ් (5) බෂාම් (........)

(24) රුම්මින්දෙයි ඇති අශෝක ස්ථම්භය සාදා ඇත්තේ,
(1) බුදුන්ගේ ඉපදීම සිහි කිරීමට (2) බුදුන්ගේ බුද්ධත්වය සිහිකිරීමට
(3) බුදුන්ගේ වප්මගුල සිහි කිරීමට (4) බුදුන්ගේ ගිහිගෙයි නික්මීම සිහි කිරීමට
(5) බුදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය සිහි කිරීමට. (........)

(25) දකුණු ඉන්දියානු හා ශ්‍රී ලංකා හමුදා අතර සිදු වූ සටන් පිළිබඳව දැක්වෙන සෙල්ලිපියක් පිහිටියේ කොහේද?
(1) අජන්තා (2) පුල්නේරා (3) බදාමි
(4) කාර්ලේ (5) භාග් (........)

- **අංක 26 සිට 30 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(26) මුල් වෛදික ආර්යයෝ,
(1) පීතෘ මූලික විය. (2) කුලභේද නොවීය.
(3) ඔවුන් සෝම පානය කළහ. (4) ගෝත්‍ර හා පවුල් වශයෙන් බෙදී සිටියහ.
(5) මුහුදු වෙළඳාම ආර්ථිකයේ ප්‍රධාන විය. (........)

(27) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳවැටීම පිළිබඳ විවිධ මත,
(1) ජල ගැලීම් (2) දේශගුණික විපර්යාස
(3) වන විනාශය (4) ප්‍රධාන නගර දෙක අතර අරගලය
(5) බාහිර ආක්‍රමණ (........)

(28) පළමු කණිෂ්ක රජු,

(1) ඩීමා කැඩ්පයිසස් රජුගෙන් පසුව රජ විය. (2) ක්‍රි.ව. 78 දී ඔහු බලයට පත්විය.
(3) රජුගේ අගනුවර වූයේ කනෞජයයි. (4) කුෂාණ රජුන් අතර ශ්‍රෙෂ්ඨ පාලකයා වේ.
(5) ශක රාජවංශයේ ආරම්භක වර්ෂය ලෙස සැලකේ. (........)

(29) වර්ණ ධර්ම අනුව,

(1) ශුද්‍ර යන්න ද්විජයන්ය.
(2) ද්විජ බවට පත්වන්නේ උපනයන්ගෙන් පසුවය.
(3) ශුද්‍රයා අනුන්ගේ බැලමෙහෙවර කළ යුතුය.
(4) බ්‍රාහ්මණයින්ට සමාජයේ ඉහළ තැන ලැබුණි.
(5) ප්‍රජාපාලනය ක්ෂත්‍රියයන්ට භාර විය. (........)

(30) නාලන්දා විශ්වවිද්‍යාලය,

(1) මහායාන බෞද්ධ මධ්‍යස්ථානයකි.
(2) ගුප්ත අවධියේ ආරම්භ විය.
(3) ජාත්‍යන්තර කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයකි.
(4) පාහියන් භික්ෂුව අධ්‍යයනය ලබා ඇත.
(5) පාලකවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලැබීය. (........)

- **අංක 31 සිට 35 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

**A හා B පමණක් නිවැරදි නම් .............** (1) ද
**B හා C පමණක් නිවැරදි නම් .............** (2) ද
**C හා D පමණක් නිවැරදි නම් .............** (3) ද
**A හා C පමණක් නිවැරදි නම් .............** (4) ද
**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම්.........** (5) ද
වරහන් තුළ ලියන්න.

**උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| **A සහ B පමණක් නිවැරදි ය.** | **B සහ C පමණක් නිවැරදි ය.** | **C සහ D පමණක් නිවැරදි ය.** | **A සහ C පමණක් නිවැරදි ය.** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය.** |

(31) අජන්තා සිතුවම්

(A) ආගමික තේමාවන් අරමුණු විය.
(B) පල්ලවයන්ගේ අනුග්‍රහය ලැබුණි.
(C) බෞද්ධ භික්ෂූන්ගේ චිත්‍ර පමණක් විය.
(D) බුද්ධ චරිතය හා ජාතක කථා සම්බන්ධ දර්ශන බහුල විය. (........)

(32) පාණ්ඩ්‍යයන්ගේ පරිහානියට හේතුව වූයේ,

(A) ආක්‍රමණ (B) අධික වියදම (C) චෝල බලය වර්ධනය

(D) අභ්‍යන්තර අරගල (........)

(33) ගුප්ත සංස්කෘතිය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදිද?

(A) හින්දු ආගමික සාහිත්‍ය ප්‍රබෝධය

(B) හින්දු ආගමේ වර්ධනය

(C) එල්ලෝරාවේ කෛලාශනාථ ද්වාලය ගොඩනැගීම.

(D) වික්‍රමශිලා හා ඕදන්තපුර විශ්වවිද්‍යාල බිහිවීම. (........)

(34) පළමුවන රාජරාජ

(A) ශ්‍රී ලංකාවම යටත් කරගන්නා ලදී.

(B) කේරළ රජයේ නාවික බලය විනාශ කරන ලදී.

(C) පාණ්ඩ්‍ය රජු ද අල්ලා ගත්හ.

(D) බෙංගාලය ජයග්‍රහණය කරවන ලදී. (........)

(35) වීර කාව්‍ය

(A) පළමුවෙන් රචනා වූයේ රාමායනයයි.

(B) එහෙත් මහා භාරතයට හේතු වූ සිද්ධිය රාමායනය කේන්ද්‍ර වූ සිද්ධියට පළමුව සිදුවිය.

(C) රාමායණය සංගම් සාහිත්‍යයට අයත් විය.

(D) වාල්මිකී රාමායනයේ කතුවරයා විය. (........)

- **අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| (36) | බදාමිය පල්ලවයන්ගේ අගනුවර විය. | පල්ලව බලය පිහිටවූ සිංහ විෂ්ණු රජු "මත්ත විලාස ප්‍රහසන" විරුදය ලබයි. | (........) |
| (37) | දකුණු ඉන්දියාවේ විශාලතම හින්දු දේවාලය තංජෝර්හි බෘහ දිශ්වර දේවාලයයි. | මෙහි ඇති නටරාජා රුව ඉන්දියානු පැරණිතම ලෝහ ප්‍රතිමාවක් සේ සැලකේ. | (........) |
| (38) | මහා භාරතය ආර්යයන් හා අනාර්යයන් අතර ගැටුම් විස්තර කරයි. | භගවත් ගීතාවේ බුද්ධචරිතය කාව්‍යයෙන් ලියා ඇත. | (........) |
| (39) | ග්‍රීක බලය ඉන්දියාව තුළ වර්ධනය වීම වැළැක්වූයේ සුංගයන්ය. | සුංග පාලකයන් යටතේ බ්‍රාහ්මණාවේ නව ජීවිතය ඇරඹුණි. | (........) |
| (40) | ගෝපාල පාල රාජවංශයේ ආරම්භකයා විය. ඔහුගේ අනුගාමිකයෝ බෞද්ධයන් විය. | බෞද්ධ විහාරවලට පාල වංශිකයෝ අනුග්‍රහ දැක්වූ අතර සුප්‍රසිද්ධ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයද තැනූහ. | (........) |

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ඉන්දීය ඉතිහාසය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

උපදෙස්:-

- **පළමුවන ප්‍රශනයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
  **(ප්‍රශ්න අංක 01 ට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01. ඔබට සපයා ඇති ඉන්දීය සිතියමේ පහත සඳහන් සියළු ස්ථාන ලකුණු කොට නම් කර ඒවායින් ඕනෑම දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(i) මක්‍රාන් (ii) යමුනා (iii) හරප්පා
(iv) කනෞජ් (v) මදුරෙයි (vi) උජ්ජේනි
(vii) අයිහෝලේ (viii) ත්‍රාමුලිප්ති

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනට ලකුණු 05 බැගිනි.)

02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩගැසීම කෙරෙහි භූගෝලීය සාධකවල බලපෑම පරීක්ෂා කරන්න.

03. හරප්පා සභ්‍යත්වයේ ආර්ථික හා සමාජ ජීවිතය පිළිබඳව පහත කරුණු ඇසුරින් සාකච්ඡා කරන්න.

(i) කෘෂි කර්මය (ii) සත්ව පාලනය, ගෘහමය සතුන් ඇති කිරීම.
(iii) දේශීය හා විදේශීය වෙළඳාම (iv) කර්මාන්ත

04. "හර්ෂ යුද්ධය හා සාමය යන දෙඅංශයේ දීම ශ්‍රේෂ්ඨයෙක් විය."

(i) හර්ෂ අයත් වූ රාජ වංශය නම් කරන්න.
(ii) හර්ෂ රජුගේ පාලනය පිළිබඳ තොරතුරු දක්වෙන මූලාශ්‍ර දෙකක නම් ලියන්න.
(iii) ඔහු කනෞජයේ සිහසුනට පත්වීම පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.
(iv) ඔහුගේ යුධ ව්‍යාපාරය හා ආගමික හා සංස්කෘතික කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න.

05. කුෂාණ පාලකයින් තම රාජධානිය තුළ බුද්ධාගම ව්‍යාප්ත කිරීමට ගෙනගිය ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න.

06. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) පශ්චාත් වෛදික ආර්යයන්ගේ සමාජ ජීවිතය
(ii) ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ ආගමික වර්ධනය
(iii) කල්‍යාණියේ චාලුක්‍යයෝ
(iv) දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ නැගීම.

07. ධර්මපාල රජු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පාලකවරුන්ගේ කාර්යය සංසිද්ධි පරීක්ෂා කරන්න.

08. දෙවන වරගුණවර්මන් රජුගේ රාජ්‍යය කාලයේ අවසානය දක්වා පාණ්ඩ්‍ය රාජ්‍යයේ ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න.

09. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පළිතුරු සපයන්න.

A ඉන්දු සහ ශක ආක්‍රමණය කෙටියෙන් හඳුන්වන්න.
ඒවායේ ප්‍රතිඵල පරීක්ෂා කරන්න.

B ඩෙකානයේ සාතවාහන පාලකයන්ගේ කාර්යය සංසිද්ධි විමසන්න.

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ සිතියම.

# ඉන්දියා සිතියම

